# UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2015
(2016 - අගෝස්තු)

කාලය පැය 03 යි

## ඉතිහාසය IV (HG 4)
### ක්‍රි.ව. 1600 දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය

**එක්** කොටසකින් යටත් පිරිසෙයින් **එක** බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මගින් පහදන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.
මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දහය (10) කි.

### පළමු වැනි කොටස

1. ක්‍රිස්තු වර්ෂ හතර වැනි සියවස දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමෙහිලා **දීපවංසයට** හිමිවන ස්ථානය ප්‍රමාණ කරන්න.
2. "දේවානම්පිය තිස්ස රාජ්‍ය සමය දිවයිනේ ඉතිහාසයෙහි වැදගත් කඩඉමකි " පහදන්න.
3. ක්‍රි.ව. දහවැනි සියවසේ අග භාගය දක්වා ශ්‍රී ලංකාවේ පැවති බදු ක්‍රමය විභාග කරන්න.
4. අනුරාධපුර යුගයෙහිදී මහායාන බුදුදහමේ සිදුවන අනුක්‍රමික වර්ධනය සැකෙවින් ගෙනහැර දක්වන්න.
5. පහත සඳහන් මාතෘකා පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

    I. සීගිරි බලකොටුව

    II. රෝහණ රජ පෙළපත

    III. චීන - ශ්‍රී ලංකා සබඳතා

    IV. පළමු වැනි විජයබාහු

### දෙවැනි කොටස

6. චෝළ සමයෙහිදී මෙරට හින්දු ආගමේ ඇති වූ පුනර්ජීවනය සැකෙවින් පහදන්න.
7. නිශ්ශංකමල්ල රජුට මුහුණදීමට සිදු වූ අභියෝග පැහැදිලි කොට ඔහු ඒවා ජය ගැනීමට සමත් වූ ආකාරය විභාග කරන්න.
8. අදාළ කාලපරිච්ඡේදයෙහි අග්නිදිග ආසියාතික රටවල් සමඟ ශ්‍රී ලංකාව පැවැත් වූ සංස්කෘතික සබඳතා සමාලෝචනය කරන්න.
9. දඹදෙණි යුගයේ සාහිත්‍ය පිළිබඳව විචාරාත්මක විග්‍රහයක් කරන්න.
10. හයවැනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය අගයන්න.